**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය**

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ | | | |
| (i) 149 වගන්තිය | සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි හෝටල්වලට බලපත්‍ර ලබාදීමේදී විගණනය කරන ලද ගිණුම් වාර්තාවේ සඳහන් මුළු ආදායම පදනම් කර ගත යුතු වුවත්, ඉන් බැහැරව සංචාරක හෝටලයේ ගණකාධිකාරී විසින් සකස් කරන ලද ආදායම් වාර්තාව පදනම් කරගෙන මෙහෙයුම් පිරිවැටුමෙන් සියයට එකක මුදලක් බලපත්‍ර ගාස්තු ලෙස අය කර ගෙන තිබුණි. | එම හෝටලයේ විගණන කටයුතු ඉටු කරන්නේ යුධ හමුදාව මගින් බවත්, වෙනත් විගණනයක් සිදු නොවන බව. | යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) 159(1) වගන්තිය | වර්ෂ 05 කට අධික කාලයක සිට හිඟ තිබෙන වරිපනම් බදු හිමියන් 12 දෙනෙකු සම්බන්ධයෙන් හිඟ වරිපනම් අයකර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපළ තහනම් කිරීම් සිදු කර නොතිබුණි. | 12 දෙනෙකුගෙන් අයකර ගත යුතුව ඇති බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| | (i) 2.1 ඡේදය | චක්‍රලේඛයේ 2.3 ඡේදයේ සඳහන් නිර්නායකයන්ට අනුකූල සමිතියක් බවට ප්‍රාදේශිය ලේකම්ගේ නිර්දේශ ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ සමිතිවලට රු.මිලියන 29.5 ක ව්‍යාපෘති පිරිනමා තිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කොන්ත්‍රාත් පවරන බව. | යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 2.2 ඡේදය | එක් සමිතියකට එක් අවස්ථාවකදී රු.මිලියන 05 ඉක්මවා ව්‍යාපෘති පිරිනමා තිබුණි. | ප්‍රජා පාදක සංවිධාන ඉදිරිපත් නොවූ බැවින් ප්‍රජා මණ්ඩල සමිතිය වෙත දුන් බවත්, ඉදිරියේදී මිලියන 05 ඉක්මවා කොන්ත්‍රාත් පිරි නොනමන බව. | -එම- |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සභාව සතු ඉඩම් 15 ක් වෘත්තීය තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කර නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් මිණුම් සිදු කිරීමෙන් පසු තක්සේරු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.8,643,976 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.5,738,191 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2023 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2022 ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,177,000 | 1,044,980 | 846,638 | 378,980 | 2,565,000 | 2,336,530 | 2,131,424 | 725,118 |
| (ii) | කුලී | 5,258,300 | 6,890,000 | 6,499,312 | 692,766 | 7,060,000 | 4,681,882 | 4,681,882 | 957,759 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,680,000 | 1,410,200 | 1,410,200 | 281,050 | 425,000 | 212,000 | 212,000 | 111,000 |
| (iv) | වෙනත් ආදායම් | 372,000 | 312,000 | 312,000 | - | 428,000 | 498,100 | 412,100 | 128,812 |
| | | 8,487,300 | 9,657,180 | 9,068,150 | 1,352,796 | 10,478,000 | 7,728,512 | 7,437,406 | 1,922,689 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කුලී** | | |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට මාකෙළි ඇල්ල රථවාහන ගාල් කිරීමේ කුලී හිඟය රු.86,003 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට නියමිත බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) මාකෙළි ඇල්ල නැරඹුම් ස්ථානය බදු දීමට අදාලව 2022 ජූලි මස සිට 2022 දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ජේදයට සහ 2023 පෙබරවාරි සිට 2023 ජූලි දක්වා වූ කාල පරිච්ජේදයට අදාල හිඟ කුලී පිළිවෙලින් රු.86,000 ක් සහ රු.85,750 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අය කරගෙන නොතිබුණි. | -එම- | -එම- |
| (iii) සමාලෝචිත වර්ෂය ආරම්භයට සති පොල කුලී හිඟය රු.113,697 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.95,754 හෙවත් සියයට 84 ක් අයකර නොතිබුණි. | අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (iv) සමාලෝචිත වර්ෂය ආරම්භයට මස් කඩ කුලී හිඟය රු.105,050 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් කිසිඳු මුදලක් අයකර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමින බව. | -එම- |

| | | |
|---|---|---|
| (v) සමාලෝචිත වර්ෂය ආරම්භයට මාළු කඩ කුලී හිඟය රු.15,277 ක්වූ අතර වර්ෂය තුලදී ඉන් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් 2024 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | -එම- |

**(ආ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.5,000,000 ක් හා මුද්දර ගාස්තු රු.7,642,515 ක් විය. | 2023 වර්ෂයට අදාල උපලේඛන මේ වන විට සකස් කරන බව. | -එම- |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකායර්ක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) මාකෙළිඇල්ල නැරඹුම් ස්ථානය බදු දීමට අදාල බදු ගිවිසුමේ අංක 07 කොන්දේසිය ප්‍රකාරව ටෙන්ඩර්කරුගෙන් මාස 03 ක ආරක්ෂක ඇප තැන්පතු ලබා ගැනීම වෙනුවට මසක කුලියට අදාල ඇප තැන්පතු ලබා ගැනීමත් , ගිවිසුමේ අංක 21 කොන්දේසිය ප්‍රකාරව හිඟ මුදල් නොගෙවීම සම්බන්ධයෙන් කාලීනව ක්‍රියා කර නොතිබීමත් නිසා සභාවට රු.171,750 ක මූල්‍ය අලාභයක් සිදු වී තිබූ අතර ඒ පිළිබඳව මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා ගිවිසුම නිවැරදි කර සකස් කර ඇති බව | යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ඉරිදා පොළ බදු දීමට අදාල ගිවිසුම ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මාස 05 ක හිඟ බදු කුලිය එකතුව රු.534,040 ක් අය කර ගැනීම සඳහා නිතිමය පියවර ගැනීමට සිදු වී තිබුණි. | එම මුදල අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති බව | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.2 **වත්කම් කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සභාව භුක්ති විඳින ඉඩම් 08 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් පවරා ගැනීම සඳහා මැනුම් කටයුතු සිදු කළ යුතුව ඇති අතර ඊට අවශ්‍ය ප්‍රතිපාදන පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලා ඇති බව. | භුක්ති විඳින ඉඩම්වල අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2006 අප්‍රේල් 15 දින පාලින්දනුවර ප්‍රාදේශීය සභාව සංස්ථාපනයේදී හිමිව තිබූ ඉඩම්වලින් 04 | මෙම ඉඩම් 04 පිළිබද තොරතුරු ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීම් කර ඇති බව. | සභාව සතු ඉඩම් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හඳුනාගෙන නොතිබුණි. | | |
| (ඇ) 1946 අංක 57 දරන පොදු සුසාන භූමි හා පුද්ගලික සුසාන භූමි පිළිබඳ ආඥා පනතේ 10 වගන්තිය ප්‍රකාරව සුසානභූමිවල ආරක්ෂාව සඳහා ආරක්ෂිත වැට මායිම් සකස් කළයුතු වුවත්, සභාව සතු කිසිදු සුසානභූමියක වැට මායිම් සකස් කර නොතිබුණි. | සුසාන භූමිවල මැනුම් කටයුතු සිදුකර පවරාගත් පසු වැට මායිම් සකස් කිරීමට කටයුතු කරන බව. | යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) පාලින්දනුවර ප්‍රාදේශීය සභා පරිපාලනය යටතේ ඇති සුසානභූමි 30 ක හිමිකම සභාව වෙත පවරා ගෙන නොතිබුණි. | පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන ලද පසු මැනුම් කටයුතු සිදුකර පවරා ගැනීමට කටයුතු කරන බව. | සුසානභූමිවල හිමිකම සභාව විසින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 පෙබරවාරි මස වන විට උඩුවන්කන්ද කපුගෙදර ප්‍රදේශයේ ජල ව්‍යාපෘතිය මගින් නල එලීම පමණක් සිදු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී රු. ලක්ෂ 10 ක ප්‍රතිපාදන ලැබී ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව. | ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය කඩිනමින් ඉටු කළ යුතුය. |

## 3. 4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව 2020 වර්ෂයේ සිට බඳවාගත් සේවකයින් 33 දෙනෙකු සඳහා 2022 වර්ෂය දක්වා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය කර තිබූ අතර ප්‍රවර්තන වර්ෂයේ වැටුප සභා අරමුදලින් දරා තිබුණි. | මෙම සේවකයින් අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් නොවන බැවින් මූ.රෙ 71 අනුමැතිය ඉල්ලා ඇති බව. | කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාගෙන ඒ අනුව සේවයේ යොදවා වැටුප් ගෙවිය යුතුය. |
| (ආ)2022 නොවැම්බර් මස සිට පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ සිට කළුතර සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ස්ථානමාරු වී ගිය නිලධාරිනියකගේ රු.202,496 ක ණය ශේෂයෙන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී ණය ශේෂය ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් ලැබිය යුතු ණය ශේෂ කඩිනමින් නිරවුල් කර ගත යුතුය. |